# සුබ පැතුම්! Greetings! සුබ පැතුම්! Greetings!

### වියට්නාමයේ ශ්‍රීලංකා තානාපති තුමාගේ සුබපැතුම් පණිවුඩය

## Lanka Viththi - an oasis in a vast desert

It is indeed a great honour and a privilege for me to express my Best wishes and Congratulation to the 15th anniversary of the publication of Lanka Viththi newspaper from London.

To those of us expatriates who were resident in Britain through our hey days of youth and the strong fervour of patriotism through the 1980s and 1990s, Lanka Viththi was akin to an oasis in the vast desert of Anglo Saxon nomadic existence. Britain has been, over the last 40 years, the land of dreams for some of us, the Sinhela expatriate youth with the adventurous spirit to attain heights of achievements not available in our motherland.

Some of us emigrated for further education, training and opportunities in to this wilderness with hardly any idea of the loneliness and solitude we may encounter. We left the tropical paradisiacal island of Sri Lanka with a rich and varied history to be proud of, a way of life that was easy to be felt privileged in global terms, yet we found ourselves in a vast social desert where fellow travelers and kindred spirits of Sinhela origin were far and few in between. Our new abode, contrary to our pre-entry presumptions was only a nominally multi-cultural society. We had better material comforts and easier entry to heights of education, professionalism and gainful opportunity in Britain than in our own motherland which was just raising itself from the powerful clouts of 500 years of European colonialism. In an age devoid of the World Wide Web, our inner souls and spirits cried out for news from Mother Lanka.

It is at this juncture that Daya Ananda Ranasinghe, a young journalist hailing from southern Sri Lanka and resident in London decided to create this journalistic oasis named Lanka Viththi for the benefit of his kith and kin who were ever so thirsty not only for news from our motherland but also as a platform for depiction of expatriate talents in Sinhela poetry, short stories, essays and even grapewine tit bits. Lanka Viththi offered the platform for literary performances from children to the aged, men and women alike. It proudly waved the flags of varied Sri Lankan services and products of immeasurable value to our expatriates.

People awaited its publications to relish the pages of diverse Sri Lankan interests. The advent of the World Wide Web has not diminished its worth by an iota. Instead Lanka Viththi entered the age of e-journalism and flourishes as ever.

Our motherland has been through the worst over the last few decades and faced all challenges from external and internal divisive forces. Our truly patriotic Lanka Viththi readers have won against all odds. The motto "**Mother & Motherland are nobler than Heaven !**" is that immortal saying of the creator, Daya Ananda Ranasinghe. Our Rana Viruwan and our national leaders who saved our motherland would never need better words than that emblazoned on our national flag to face any challenges to save our mothers and the land which we all yearn to worship again and again before we depart from this earth.

**♦ Dr Ivan Amarasinghe**
**Ambassador Extraordinary and Plenipotentiary**
Embassy of the Democratic Socialist Republic of Sri Lanka
in the Socialist Republic of Viet Nam
55B Tran Phu Street
Ba Dinh District
Ha Noi
**Socialist Republic of Viet Nam**

## සීමා මායිම් නැති තානාපති

ලංකාවෙන් බැහැර ලෝකයේ පළවූ ප්‍රථම සිංහල පුවත්පත ලෙස ඉතිහාසයට එක්ව තිබෙන ලංකාවිත්ති පුවත්පතෙහි අභිමානවත් පහළොස්වන සංවත්සරය සමරණ මෙම අවස්ථාවෙහි එයට සුබපතන සහෘදයින් අතරට එක්වීමට ලැබීම අපට ද භාග්‍යයකි. ඉංග්‍රීසි අධිරාජ්‍යයේ මතුමහල සේ සලකනු ලබන එංගලන්තයේ ලන්ඩන් නගරයෙහි ජීවත්වන සිංහල පාඨක සමාජයෙහි මනදොළ සපුරණ ලංකා විත්ති සීමා මායිම් නොමැති තානාපතිවරයෙකු සේ මම දකිමි.

විවිධ හේතු නිසා මව්බිම අතහැර යුරෝපයට පැමිණ සිටින සිංහල ජනතාවගේ හෘදයාංගම මිත්‍රයෙකු මෙන්ම සමාන සුඛ දුක්ඛ ඥාතියෙකු ලෙසද ලංකාවිත්ති විශිෂ්ට මෙහෙවරක් ඉටුකරයි.

යුරෝපයේ ජීවත්වන අයෙකුට සිංහල කුමකටදැයි සිතන්නෝද විරල නොවෙති. එහෙත් ඉංග්‍රීසි සමාජය තුළ සිංහල සිහින දකින අය නොවෙතියි අපට කිවහැකිද? උපන් බිමට වඩා තැනක් කාට හෝ තිබිය හැකිද? ඒ ජාතික අභිමානය අකා මකා දැමිය හැකි මුග්ධයෝ ද වෙති. එහෙත් සත් මුහුද පීනා එන මඳ නලක, අපමණ අහස් කුස සිසාරා එන වළාරොදක ඒ ජාතික මදනල දැවටීගෙන නොඑන්නේද?

ලංකාවිත්ති ඒ ජාතික හඬත්, ජාතික ලකුණත් මත පදනම් වූ හෙළ ගීයක් වැන්න. එහි සකසු දයා ආනන්ද රණසිංහයෝ මව්බිම සිසාරා එන මදනලින්ද, ඇලදොල ගහකොළ සිඹ එන විහඟ නදින්ද ප්‍රමුදිතව ඒ හඬ, ඒ රුව ගුණ සිය පුවත්පත තුළින් දනවන අයුරු රමණීය ය. කමණීය ය. සිංහලකමත්, සිංහල ගමත් පිළිබඳව විචිත්‍ර මතක අවදිකරවමින් පසළොස් වසරක් මුළුල්ලේ එමගින් සිංහල පාඨකයින්ට වූ මෙහෙවර අපමණ ය, අසාමාන්‍ය ය, අමිළ ය, විශිෂ්ට ය.

ඉන්දියන් සාගරයේ මුතු ඇටය කඳුළකට සමහරු සමාන කරති එහෙත් ඒ කඳුළ දුරු රටක වියළි සිනහවකට වඩා ප්‍රිය නොවන්නේද? ඒ සියල්ල හඳුනන ලංකාවිත්ති පුවත්පත සුදිලේවායි මම ප්‍රාර්ථනා කරමි.

♦ ***ගාමිණී සුමනසේකර***
**ප්‍රධාන කර්තෘ**
***දිවයින ඉරිදා සංග්‍රහය - ශ්‍රීලංකාව***

## ලංකා විත්ති

පත්‍රයක් සංස්කරණය කරමින් ද, එම පත්‍රය සිය ධනව්‍යයෙන් ප්‍රකාශයට පත්කරමින් ද, ප්‍රධාන ලේඛකයා වශයෙන් එම පත්‍රයට බහුතරයක් ලිපි සම්පාදනය කරමින් ද අඛණ්ඩව පුරා පසළොස් වසරක් පත්‍රයක් පවත්වාගෙන ගිය පුද්ගලයෝ මෙලොව වෙත් නම් ඒ කීයෙන් කී දෙනෙක් ද? දයා ආනන්ද රණසිංහ ඒ අතුරෙන් එක් අයෙකි. පත්‍රය නම් ලංකාවිත්ති යි. ලන්ඩනයේ මුද්‍රණය කරන ලංකා විත්ති පත්‍රය ලංකාවේ සිටින මට ද කලට වේලාවට තැපෑලෙන් ලැබේ. එය හැමදාමත් කියවීමේ රුචිය දල්වා ලන පුවත්පතකි.

ලංකාවේ සිංහළ දෙමළ ඉංග්‍රීසි පත්‍ර වලින් ද, වෙබ් අඩවි වලින් ද අපේ මිනිසුන් ගැන බොහෝ තොරතුරු අනාවරණය වුව ද ලංකාවිත්තියේ ආ ඇතැම් පුවතක් අලුත් ය. නැතහොත් එය අනෙක් මාධ්‍යවලට වඩා වෙනස් ය.

ඇතැම් නිර්මාණවලට වස්තුවිෂය වී ඇති නො රට අත් දැකීම් ආගන්තුක ය. ආගන්තුක නිසාම නැවුම් ය. කෙසේ වෙතත් ලංකා විත්තියෙන් පෙනෙන්නේ දයාගේ අප්‍රතිහත ධෛර්යය යි. රට හා ලංකා ජනතාව පිළිබඳ ඔහු තුළ පවත්නා ආදරය යි. ඔහුගේ නිර්මාණශීලිත්වය යි.

♦ ***මහාචාර්ය සුනිල් ආරියරත්න***
**Sri Lanka**

## මගේ සුබ පැතුම්!

ලංකාවෙන් පිටත දී ලංකාව පිළිබඳව අඛණ්ඩව පළ කෙරෙන ප්‍රකාශනයක් ලෙස ලංකාවිත්ති පුවත්පත වෙනත් ප්‍රකාශනයනට වඩා ඉස්මතුව සිටී. එහි පිටුපස සිටින මහා බලවේගය දයා ආනන්ද රණසිංහ යැයි පැවැසීම අතිශයෝක්තියකැයි නොසිතේ. පහළොස් වසර සපුරණ ලංකා විත්ති පුවත්පතටත්, අපේ හිතවත් දයාටත් මා හෘදයංගම ව සුබ පතන්නේ ඉදිරියේදීත් හැම මසක ම ලංකා විත්ති කියවන්නට ඇති ආසාව නිසාම ය.

♦ ***මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු***
**Sri Lanka**

## මව්බිමට ලැදි මව්බසට ලැදි ලංකාවිත්ති

දයා ආනන්ද රණසිංහගේ අන්තර්ජාලය ලොවපුරා විසිරී සිටින සිංහලයන් එකම රැහැනකට ගත්තේ ඉන්ටර්නෙට් එන්නටත් කලිනි. ඒ ලංකා විත්ති මාසික පුවත්පතිනි.

මව්බිමට ලැදි - මව්බසට ලැදි නන් දේශවාසී සිංහලයන්ට ලංකාවිත්ති ලන්ඩන් වාසීන්ගේ තොරතුරු බෙදාදුන්නේය. මේ මාහැඟි කටයුත්ත පුරා 15 වසරක් අඛණ්ඩව පවත්වාගෙන යෑම පහසු කාර්යයක් නොවේ.

දයා ආනන්ද රණසිංහ ස්වේච්ඡාවෙන් ආරම්භකර, අප්‍රමාණ කැපවීමෙන්ද, අධිෂ්ඨාන ශක්තියෙන්ද පවත්වාගෙන යන ලංකාවිත්ති චිරාත් කාලයක් පවතීවායි ආශීර්වාද කරමි.

♦ ***තිලකරත්න කුරුවිටබණ්ඩාර*** **Sri Lanka**

## හෘදයංගම සුබපැතුම්!

එක්සත් රාජධානියේ පළවන ලංකාවිත්ති සිංහළ පුවත්පතට වසර පහළොවක් පිරීම අතිශය සතුටකි! එය ඇදහිය නොහැකි තරම්ය. එහි කතුවරයා වන දයා රණසිංහ මහතා එම පුවත්පත එළි දක්වන්නට දරන පරිශ්‍රමය, වැය කරන ශක්තිය කාලය කොතෙක් දැයි අපි හොඳින් දනිමු.

පුවත්පත පළවූ මුල් දවසේම ලන්ඩනයේ ඇතැම් අය - මේ පත්තරේ මාස දෙක තුනකට වඩා ජීවත්වන්නේ නැතැයි කී අයුරු මට හොඳින් මතකය. එහෙත් ඒ සියළු කීම් නිශ්ප්‍රභා කරමින් ලංකාවිත්ති වසර 15 ක් අඛණ්ඩව මුද්‍රණයෙන් නිකුත්ව සිංහළ පාඨකයා වෙතට පැමිණීම ප්‍රශංසනීය ය. සැබැවින්ම එය ඉබේම අපේ සිංහළ ජන කොට්ඨාශයේ කොටසක් බවට පත්වෙමින් මාසිකව නිකුත්වන තුරා අප හැම නොයිවසිල්ලෙන් තබන්නට සමත් විය.

මෙම පුවත්පත නිතර අප රටට අදාළ වැදගත්, එමෙන්ම ඉතා සංවේදී දේශපාලන ප්‍රශ්න සාකච්ඡාවට භාජනය කළා පමණක් නොව එල්ටීටීඊ ත්‍රස්තවාදයේ කුරිරුකම් කොතෙක් දැයි අප ජනතාව දැනුම්වත් කළාය.

ඉතා සාර්ථක පහළොස් වසරක් මේ මස සමරණ ලංකාවිත්ති පුවත්පතට ද, එහි කතුවර දයාට ද අපේ හෘදයාංගම සුබ පැතුම්!

♦ ***ඩග්ලස් වික්‍රමරත්න***
***සභාපති***
***එක්සත් රාජධානියේ සිංහළ සංගමය***

## අපේ හෘදයාංගම ස්තුතිය!

මෙම පහළොස් වන සංවත්සර කලාපය පිළියෙළ කරන්නට අවශ්‍ය සියල්ල සම්පාදනය කරගැන්මට මූලිකවූ භවතුන්ට අනේක වාරයක් ස්තුතිවන්ත වෙමු!

සුබ පැතුම් පණිවුඩ එවූ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට
ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් තුමාට
වියට්නාමයේ ශ්‍රීලංකා තානාපති ආචාර්ය අයිවන් අමරසිංහ මහතාට

ශ්‍රීලංකාවේ සහ විදේශවල පත්කතුවරුන්ට, විද්වත් මහාචාර්ය තුමන්ලාට, මාධ්‍යවේදින්ට, ලේඛකයින්ට සහ කිවි කිවිඳියන්ට

ශ්‍රීලංකාවේ ප්‍රවීන චිත්‍ර ශිල්පී තලංගම ජයසිංහ මහතාට

රිවිර පුවත්පත් ආයතනයේ ඩබ්ලිව්. කේ. ඩී. නවරත්න මහතාට සහ චතුර එස්. කොඩිකාර ඡායාරූප ශිල්පියාණන්ට

ටවර්හෝල් රඟහල පදනමේ උපදේශක සිරි කහවල මහතාට

ජාතික සංවර්ධන බැංකුවේ සහන් රණසිංහ මහතාට

සහ විශේෂයෙන් නුගේගොඩ සරසවි ප්‍රකාශක ආයතනයේ අධිපති ප්‍රේමසිරි මහතාට

**ලංකාවිත්ති කතුමඬුල්ල**

## ලංකා විත්ති දිනේවා !

ලංකා විත්ති පුවත්පතට අවුරුදු පහළොවක් පිරීම විශේෂිත සිද්ධියකි. ලංකාවෙන් බැහැරව ලෝකයේ පළකරන ලද ප්‍රථම සිංහළ පුවත්පත එය යැයි සිතමි. ආරම්භයේ සිට ම මම එහි පාඨකයෙකු වීමි. ඒ ගැන මට ඇත්තේ ඉමහත් ප්‍රීතියකි.

ලංකාවිත්ති පළවීම ආරම්භ කෙරුණේ ලංකා ඉතිහාසයේ ඉතාමත් තීරණාත්මක අවධියකදී ය. කොටි ත්‍රස්තවාදය දිනෙන් දිනම වැඩෙත් දී ඔවුන්ගේ හා දෙමළ ජාතිවාදයේ අසත්‍ය ප්‍රචාරවලට දිවයිනෙන් බැහැරව සිටින සිංහළයින්ට, විශේෂයෙන්ම එංගලන්තයේ වාසය කරන සිංහළයන්ට දැනගැනීමට හැකි අයුරෙන් පිළිතුරුදීම අත්‍යවශ්‍ය කටයුත්තක් බවට පත් වී තිබිණ. ලංකාවිත්ති පුවත්පත ඒ වගකීම නිසි ලෙස හා අභිමානයෙන් ඉටු කරන ලද බව අතිශයෝක්තියෙන් තොරව ප්‍රකාශ කළ හැකි ය.

දෙමළ ත්‍රස්තවාදය පරාජය වී ඇති නමුත් දෙමළ ජාතිවාදය තවමත් ක්‍රියාත්මක වෙයි. විශේෂයෙන් ම එංගලන්තයේ එය නොයෙකුත් දෙනාගේ ආධාරය මත තවමත් පවතියි. ලංකාවට නුදුරු අනාගතයේදී මහත්ම තර්ජනයක් වනු ඇත්තේ පිටරට සිටින විසිරුණු දෙමළ ජනයා ය. ඔවුන්ගේ හා ඔවුන්ගේ ආධාරකරුවන්ගේ අසත්‍ය ප්‍රචාර සම්බන්ධයෙන් එංගලන්තයේ වාසය කරන සිංහලයන් දැනුම්වත් කර ඔවුන් මතවාදීව සන්නද්ධ කිරීමටත්, අවසානයේදී දෙමළ ජාතිවාදය පරාජය කිරීමට ද දායකවීමටත් ලංකා විත්ති පුවත්පතට ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි ඉත සිතින් පතමි!

♦ ***මහාචාර්ය නලින් ද සිල්වා*** **Sri Lanka**

## ලංකා විත්තියට පසළොස් වසරක් !

අද ඩයස්පෝරා යන වචනය ඉතා ජනප්‍රිය වචනයක් වී තිබේ. අප සිංහල ඩයස්පෝරාව ගැන කියන විට මහා බ්‍රිතාන්‍ය වාසී සිංහල ඩයස-පෝරාවේ පුවත්පත වන්නේ ලංකාවිත්තියයි. වසර පහළොවක් එය ධෛර්‍යසම්පන්නව පවත්වාගෙන ඒම ගැන අප ආනන්ද රණසිංහයන්ට සුබ පැතිය යුතුය.

මහා බ්‍රිතාන්‍ය වාසී සිංහල පාඨකයන්ට මහත් සෙතක් සළසමින්, ඔවුන්ට මව්බිම හා මව්බස පිළිබඳව තුටු හැඟුම් දනවමින් පළකැරෙන මෙය යුරෝපයේ වෙනත් රටවල (ප්‍රංශය ඉතාලිය ජර්මණිය වැනි) වෙසෙන සිංහළ පාඨකයින් අතරද ජනප්‍රියව ඇති බව මා දුටුවේ 2001-2 කාලයේ දෙවසරක් ලන්ඩන් විශ්වවිද්‍යාලානුබද්ධ ආසියා අප්‍රිකා අධ්‍යන ශාස්ත්‍රාලයේ (SOAS) උගන්වමින් සිටි අවධියේය. විටෙක මමද ඊට ලිපි සැපයුවෙමි. අන්‍යයන් ලියූ ලිපි අභිරුචියෙන් කියැවීමි. මා ලංකාවිත්ති පළවන දිනය තෙක් බලා සිටියේ මහත් ආසාවෙනි. අන්‍ය බොහෝ පාඨකයෝද එසේම සිටියහ. දැනුදු සිටින බව මට සහතික ය. එහෙයින් ලංකාවිත්තිය පහළොස් වන වසරට එළඹි මේ අවස්ථාවේ මගේ උණුසුම් සුබ පැතුම් මෙසේ එවමි.

♦ ***මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස***

## සුභාශිංසනයයි!

දයා ආනන්ද රණසිංහ මැතිතුමා විසින් මෙයට වසර 15 කට පෙර ආරම්භ කරන ලද ලංකාවිත්ති පුවත්පතට මෙම අවස්ථාවේදී සුභාශිංසනය කරන්නට ලැබීම ඉතා භාග්‍යයක් කොට සලකමි. තමන්ගේකමත්, රටත්, ජාති යත්, ආගමත් ගැන මසකට වරක් මතක්කරදී, ඒ අනුව තම ජීවිත සකස්කරගත හැකි මග කියාපාන, ලාංකීය ඌරුවට බිහිකරන ලද මෙම කුඩා පුවත්පත බොහෝ සිංහලයෝ මෙන්ම උගත් ඉංග්‍රීසි ජාතිකයෝද ඕනෑකමින් කියවති.

තම රටත්, ජාතියත්, ආගමත්, භාෂාවත් ඒ හා සම්බන්ධ සිරිත් විරිත් අමතක කරන අය සිටිති. එවැනි කිසිවෙකුට සහ්‍යත්වයක් නැත. එබඳු වාතාවරණයක් තුළ ලංකාවිත්ති කතුතුමා පසුගිය වසර 15 තුළ ගන්නා ලද අප්‍රතිහත ධෛර්‍යය ඉතා උසස් කොට සලකන අතර තවත් දීර්ඝ කාලයක් මෙම පුවත්පතට ඉහත සඳහන් තේමාවන් අගය කරමින් ඉදිරියටම යා හැකිවේවායි! ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

♦ ***පූජ්‍ය විතාරන්දෙනියේ කස්සප නාහිමි***
**බර්මිංහැම් මහා විහාරය Birmingham UK**